මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR/2010/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01

2020.04.01

**සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත**

**COVID-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ නව ප්‍රතිමූල්‍යකරණ පහසුකම හඳුන්වා දීම සඳහා වූ මෙහෙයුම් උපදෙස් හා සබැඳි පරිශිෂ්ඨය.**

**(“සෞභාග්‍යා COVID-19 පුනරුද සහන” ණය පහසුකම)**

COVID-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ණය සහන ලබා දීම සඳහා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද 2010.03.22 දිනැති RDD/PR/2010/03 දරණ සංශෝධිත මෙහෙයුම් උපදෙස් හි පරිශිෂ්ඨයකි.

**1. හැඳින්වීම**

1.1 සමස්ථයක් ලෙස, ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වයට සහ රටේ ආර්ථික වර්ධනයට සිදුවිය හැකි බාධාවන් සැලකිල්ලට ගෙන COVID-19 වසංගතයෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයන් නැවත නඟා සිටුවීමේ ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් COVID-19 වසංගතය හේතුවෙන් බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියා ඇතුළුව ව්‍යාපාර සඳහා රුපියල් බිලියන 50ක අර්ධ වාර්ෂික (මාස 6ක) ප්‍රතිමූල්‍යකරණ පහසුකම සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජයේ උපදෙස් පරිදි සහන මාලාවක් 2020.03.27 දිනැති 2020 අංක 05 දරණ මූල්‍ය මණ්ඩල චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇත.

1.2 මෙම මෙහෙයුම් උපදෙස් සඳහා වන පරිශිෂ්ඨයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන දැනට ක්‍රියාත්මක වන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ වෙනමම ප්‍රතිමූල්‍යකරණ සංරචකයක් ලෙස COVID-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන සැපයීමයි. ඒ අනුව, COVID-19 හේතුවෙන් දැඩි බලපෑමට පත් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් නව ණය සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ හඳුන්වා දී ඇති මෙම නව ප්‍රතිමූල්‍යකරණ සංරචකය හරහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන වලට හැකියාවක් පවතී.

1.3 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන ණය සංරචකයන්ගෙන් වෙන්කර හඳුනාගැනීම සඳහා මෙම නව ප්‍රතිමූල්‍යකරණ පහසුකම “සෞභාග්‍යා COVID-19 පුනරුද සහන” ණය පහසුකම ලෙස හඳුන්වනු ලැබේ.

1.4 තවද, මෙමඟින් 2010.03.22 දිනැති RDD/PR/2010/03 (සංශෝධිත) දරන මෙහෙයුම් උපදෙස් මඟින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය සඳහා දක්වා ඇති නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතින බවත් මෙම නව පරිශිෂ්ඨය නිකුත් කිරීමෙන් 2010.03.22 දිනැති RDD/PR/2010/03 (සංශෝධිත) දරණ මෙහෙයුම් උපදෙස් මඟින් එම ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන බවත් දන්වනු ලබයි.

2. **මෙහෙයුම් ප්‍රදේශ :** දිවයිනේ සියලුම ප්‍රදේශ

## 3. අරමුදල්

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ හඳුන්වා දී ඇති නව ප්‍රතිමූල්‍යකරණ සංරචකය වන සෞභාග්‍යා COVID-19 පුනරුද සහන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අරමුදල් සපයනු ඇත.

## 4. සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ක්‍රියාත්මක කිරීම

4.1 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ නව ණය සංරචකයක් ලෙස "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ක්‍රියාත්මක වනු ඇත.

4.2 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ මෙන්ම සෞභාග්‍යා COVID-19 පුනරුද සහන හි ද ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ඇත.

## 5. බලාත්මක දිනය

2010.03.22 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 දරන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ ඇති මෙහෙයුම් උපදෙස් සඳහා වූ මෙම පරිශිෂ්ඨය 2020.04.01 දින සිට බලාත්මක වනු ඇත.

## 6. සහභාගීත්ව මූල්‍ය ආයතන

6.1 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම්ලත් සහභාගීත්ව මූල්‍ය ආයතන සියල්ලම "සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම ක්‍රියාත්මක කිරීමට සුදුසුකම්ලත් සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස ද සළකනු ලැබේ.

6.2 තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ නිර්දේශය මත ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ඉහත සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ණය පහසුකම ලබාදීමේ සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස සුදුසුකම් ලබයි. මෙම සහන ණය යෝජනා ක්‍රමය යටතේ, එසේ සහභාගි වීමට කැමති බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බලපත්‍රලාභී විශේෂ බැංකු 2020.04.15 දිනට හෝ එදිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ වෙත සිය කැමැත්ත ප්‍රකාශ කළ යුතුය. එසේ වූවද, ඉහත ආකාරයට කැමැත්ත ප්‍රකාශ කරන ලද බැංකු, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස සළකනු නොලැබේ.

6.3 එක් එක් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා අදාළ ප්‍රතිමූල්‍යකරණ සීමාවන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තීරණය කර දැනුම් දෙනු ඇත.

## 7. සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් හා ණය අයදුම්කරුවන්

7.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ දෙවන පරිච්ඡේදයට අනුව COVID-19 වසංගත තත්ත්වයට පෙර සිට ක්‍රියාත්මකව පැවති ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් ක්‍රියාත්මක කළ ඕනෑම ආදායම් උත්පාදන ක්‍රියාවලියක් හෝ ආර්ථික ක්‍රියාදාමයක් එකී කටයුතු යළි සක්‍රීය කිරීම උදෙසා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබයි. මෙකී අරමුණ උදෙසා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දෙනු ලබන ණය සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

7.2 “සෞභාග්‍යා COVID-19 පුනරුද සහන ණය” පහසුකම යටතේ, දැනට පවතින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යනය කිරීම පිණිස ණය ලබා දෙනු ලැබේ.

7.3 සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ මීට පෙර හෝ දැනටමත් COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති ණය ගැණුම්කරුවන් ද මෙම පරිශ්ෂ්ඨය යටතේ ණය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

**8. “සෞභාග්‍යා COVID-19 පුනරුද සහන” ණය පහසුකමෙහි මූලික ලක්ෂණ**

| | |
|---|---|
| 8.1 උපරිම ණය මුදල | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෙකුට/උප ණය ගැනුම්කරුවෙකුට රුපියල් මිලියන 25කට යටත්ව මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයට සරිලන ණය මුදලක් |
| 8.2 ණය ගැනුම්කරු විසින් සහභාගීත්ව මූල්‍ය අයතන වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකය | අ) වසරකට සියයට 4කි<br>ආ) සහභාගීත්ව මූල්‍ය ආයතන කිසිඳු අයුරකින් සියයට 4ක් ඉක්ම වූ පොලී අනුපාතයක් අය නොකළ යුතුය. |
| 8.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකය | වසරකට සියයට 1කි |
| 8.4 සහන කාලය | අ) ව්‍යාපාර කටයුත්තේ ස්වභාවය මත පදනම්ව, මාස 6ක උපරිම සහන කාලයක්<br>ආ) මෙකී සහන කාලය තුළ ණය ගැනුම්කරුවන් ප්‍රාග්ධනය හෝ පොලිය ගෙවීම අවශ්‍ය නොවේ. |
| 8.5 ණය ආපසු ගෙවීමේ කාලය | සහන කාල සීමාව ද ඇතුලත්ව උපරිම කාලය මාස 24කි. |
| 8.6 ඇප සුරැකුම් | ආර්ථික කටයුත්තේ ශක්‍යතාවය කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. එසේ වුවත් “සෞභාග්‍යා COVID-19 පුනරුද සහන” ණය පහසුකම යටතේ ලබාදෙනු ලබන ණය සඳහා, අවදානම අවම කිරීමේ උපක්‍රමයක් ලෙස සුදුසු පරිදි ඇප සුරැකුම් ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන වලට හැකියාව ඇත. |

**9. ණය ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම**

9.1 තම ශාඛා මට්ටමින් COVID-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වූ අයදුම්කරුවන් හෝ/ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගැනීමට හා 2020.04.30 දිනට පෙර එකී අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් සහභාගීත්ව මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාල මඟින් අදාළ මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය.

9.2 “සෞභාග්‍යා COVID-19 පුනරුද සහන” ණය පහසුකම යටතේ ණය ලබා ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් පිළිබඳ විස්තර මෙම පරිශිෂ්ඨය සහභාගීත්ව මූල්‍ය ආයතන ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ණය ලියාපදිංචි අයදුම්පත් භාරදීමේ අවසාන දිනය 2020.05.22 වේ.

9.3 ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා දත්ත ඇමුණුම් 1 (ආ) මෘදු පිටපත, උප ණය අයදුම්පත් ලැබී දින 10ක් තුල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් දැනුම් දෙනු ලබන ලිපිනයන්ට විද්‍යුත් තැපැලෙන් යොමු කළ යුතුය.

9.4 ඇමුණුම (අ) සහ (ආ) යටතේ ලබාදෙනු ලබන තොරතුරු වල අනුකූලතාවය සහ නිවැරදි භාවය සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතුය.

9.5 අදාල සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණයට යටත්ව, වැඩ කරන දින 5ක් තුළ දී ඇමුණුම (ආ) හි සඳහන් තොරතුරු මත පදනම්ව අයදුම්පත් ලද අනුපිළිවෙලට අනුව උප ණය අයදුම්කරුවන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරනු ලැබේ. කෙසේ වුවද, ඇමුණුම (අ) සහ ඇමුණුම (ආ) හි දාම අයදුම්පත් ලැබීමෙන් පසුව එම ඇමුණුම් වල යම් වෙනසක් නිරීක්ෂණය වුවහොත්, සහභාගීත්ව මූල්‍ය ආයතනයට පූර්ව දැනුම් දීමකින් තොරව අදාල උප ණය ගැනුම්කරුගේ ණය ලියාපදිංචිය අවලංගු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

9.6 යම් හෙයකින් අමතර තොරතුරු අවශ්‍ය විටෙක හෝ අමතර පැහැදිලි කිරීම් අවශ්‍ය වන අවස්ථාවක කිසියම් අයදුම්පතක් නැවත සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත යොමු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

9.7 උප ණය අයදුම්කරුවන් ලියා පදිංචි කිරීමෙන් අනතුරුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කළ ණය සඳහා ලියා පදිංචි අංකයක් නිකුත් කොට එම අංකය සහභාගීත්ව මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දෙනු ලැබේ. කිසියම් ණය අයදුම්කරුවෙකු සම්බන්ධ ඉදිරි කටයුතු වලදී මෙකී ලියාපදිංචි අංකය භාවිතා කළ යුතුය.

**10. උප ණය මුදා හැරීම**

10.1 කිසියම් ණය අයදුම්කරුවෙකු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කර සති 1ක් තුළ ඊට අදාළ ණය මුදල සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මුදා හැරිය යුතුය.

10.2 යම් හෙයකින් කිසියම් ණය මුදලක් සති 1ක් තුළ මුදා හැරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන අපොහොසත් වේ නම් ඊට අදාළ හේතු දක්වමින් ඒ පිළිබඳව නොපමාව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතු අතර එහි ලා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සුදුසු පරිදි අවශ්‍ය තීරණ/ක්‍රියාමාර්ග වෙත එළඹෙනු ඇත.

10.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් කිසියම් ණය මුදලක් දින 30ක් තුළ මුදා නොහැරීම හා ඒ පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පිළිගත හැකි හේතුන් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකී ණය ලියාපදිංචිය සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු වේ.

10.4 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විශේෂ හේතුන් නිසා මුදා හැරීමට නොහැකි වූ ලියාපදිංචි වී ඇති ණය පිළිබඳ වාර්තාවක් 2020.06.15 දින හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**11. ප්‍රතිමූල්‍ය ක්‍රමවේදය**

11.1 මෙම පරිශිෂ්ඨයෙහි සඳහන් නියමයන් සහ කොන්දේසි වලට අදාළව උප ණය සඳහා 100%ක ප්‍රතිමූල්‍ය පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත සැපයෙනු ඇත.

11.2 ලියාපදිංචි ණයකරුවන් වෙත ණය මුදල් මුදා හැරීමෙන් පසු ප්‍රතිමූල්‍ය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය. සෑම ප්‍රතිමූල්‍ය අයදුම්පතක් සමඟ පහත ලේඛන ලැබීමට සැලැස්විය යුතුය.

i. ප්‍රතිමූල්‍ය සඳහා වන අයදුම්පත - ඇමුණුම II
ii. ප්‍රතිමූල්‍ය සඳහා ණය මුදා හරින ලද ණය සඳහා අදාල වන ප්‍රකාශනය - ඇමුණුම III
iii. ඉල්ලුම් පොරොන්දු පත්‍රය - ඇමුණුම IV

iv. භාරදීමේ කුවිතාන්සිය - ඇමුණුම V
v. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහතික වන ආකාරයේ පැවරුම - ඇමුණුම VI
vi. ණය මුදා හැරීමේ ලිපිය - ඇමුණුම VI

11.3 අදාළ සියළු ලිපි ලේඛන සහ තොරතුරු සහිතව සම්පූර්ණ කරන ලද ප්‍රතිමූල්‍ය අයදුම්පත් ලැබීමෙන් අනතුරුව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිවැරදි අයදුම්පත් ලැබී වැඩකරන දින 14ක් ඇතුලත ලැබූ අනුපිළිවෙල අනුව සහ අදාල මූල්‍ය ආයතනයට වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණය සලකා ප්‍රතිමූල්‍ය මුදා හැරීම සිදු කෙරේ.

11.4 ප්‍රතිමූල්‍ය සඳහා හිමිකම් පෑම් අදාළ මූල්‍ය ආයතන වල ප්‍රධාන කාර්යාලය හරහා ණය මුදා හැරීමෙන් දින 30ක් ඇතුලත ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය. මූල්‍ය ආයතන ශාඛා වලින් ලැබෙන එවැනි අයදුම්පත් පිළිබඳ සළකා ලබනු නොලැබේ.

11.5 සෑම උප ණය ගැනුම්කරුවෙකුගේම ණය ආපසු ගෙවීමේ ලේඛනය මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නැවත ගෙවීම සම්බන්ධයෙන් සකසන ලද ලේඛනය අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් අර්ධ වාර්ෂිකව සිදු කල යුතුය.

## 12. ණය ආපසු ලබා ගැනීම

12.1 එක් එක් ණය සඳහා අදාල කොන්දේසි අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රාග්ධන මුදල සහ පොලිය ණයකරුවන්ගෙන් අයකර ගත යුතුය.

12.2 සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මුදා හරින ලද ප්‍රාග්ධනය සහ පොලිය නැවත අයකර ගැනීම අර්ධ වාර්ෂිකව, එනම් සෑම සවරකම ජූනි 30 සහ දෙසැම්බර් 31 සිදු කරන අතර 2020.12.31 දින සිට ප්‍රතිමූල්‍ය ලබා දුන් දිනය පදනම් කර ගනිමින් සිදු කරයි.

## 13. ලිපි ලේඛන වල ආරක්ෂාව

13.1 අයදුම්කරුගේ යම් අලාභ සම්බන්ධයෙන් තක්සේරු කිරීමේ දී සියලු සාක්ෂි ලබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය යටත් විය යුතුය. එවැනි ලියකියවිලි පරීක්ෂා කිරීමට හෝ වෙනත් අවශ්‍යතාවයක් සඳහා අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

13.2 ණය මුදා හැරීම සම්බන්ධ වෙනත් අදාළ ලියකියවිලි බැංකු ශාඛා මට්ටමින් හෝ ප්‍රධාන කාර්යාලය සන්තකයේ අභිමත පරිදි තබා ගත හැකිය.

## 14. ගිණුම් විගණනය කිරීම

14.1 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෑම ප්‍රතිමූල්‍ය සංරචකයක් යටතේ ම වාර්ෂික ගිණුම් ප්‍රකාශන සකස් කරන අතර, එවැනි ගිණුම් ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරනු ලැබේ.

14.2 තවදුරටත්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විශේෂ අභ්‍යන්තර විගණන සිදු කිරීමෙන් උප අලාභ සම්බන්ධයෙන් සිදු කරන තක්සේරු තහවුරු කර ගත යුතුය.

## 15. සහභාගීත්ව මූල්‍ය ආයතන වල කාර්යභාරය සහ වගකීම්

"සෞභාග්‍යා COVID-19 පුනරුද සහන" ණය පහසුකම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන වල ක්‍රියාකාරි සහභාගීත්වය අපේක්ෂා කෙරේ. මෙම පරිශිෂ්ඨයෙහි ඇතුලත් අවශ්‍යතා වලට අමතරව පහත සඳහන් කාර්යභාරයන් හා වගකීම් සම්බන්ධයෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන අනුගත විය යුතුය.

15.1 මෙම ණය යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත කාල සීමාවක් තුළදී ප්‍රමාණවත් වන සේවක පිරිසක් ප්‍රධාන කාර්යාලය සහ ශාඛා මට්ටමින් යෙදවීම.

15.2 මෙම ණය යෝජනා ක්‍රමයේ සම්බන්ධීකරණ කටයුතු සඳහා වෙන් වූ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලයෙ හි පත් කල යුතුය.

15.3 මෙම ණය යෝජනා ක්‍රමයෙහි අරමුණු මත පමණක්ම ණය අයදුම්කරුවන් ණය ලබා ගන්නා බව තහවුරු කර ගනිමින් ණය මුදා හැරීමට විචක්ෂණශීලි විය යුතුය.

15.4 ණය ලබාදීම සහ නැවත අයකර ගැනීම සම්බන්ධ සම්පූර්ණ වගකීම දැරීම

15.5 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙන අවස්ථා වල කිසිඳු හේතුවක් මත, පරිශිෂ්ඨයෙහි සඳහන් අගයට වැඩි පොලී අනුපාතිකයක් යටතේ ණය ලබා නොදිය යුතුය.

15.6 සෑම නව උප ණය ප්‍රමාණයක්ම මුදා හැරීමට පෙර ණය ගැනුම්කරු COVID-19 වසංගතය හේතුවෙන් පීඩාවට පත්ව ඇති බවට තහවුරු කර ගත යුතුය.

15.7 ණය ගිණුම් සම්බන්ධයෙන් ගිණුම් පොත්වල තත්ත්වය පිළිබඳ නිරන්තරයෙන් පරීක්ෂාකාරි වෙමින් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත සිදුවිය හැකි අලාභ අවම කර ගැනීමට හැකි සෑම විටම කටයුතු කල යුතුය.

15.8 ගිණුම් පවත්වා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන

i. බැංකු විසින් ණය තක්සේරු, අනුමත කිරීම, ණය මුදා හැරීම, නැවත අයකර ගැනීම සහ වෙනත් කරුණු පිළිබඳ වාර්තා සුදුසු පරිදි ලෙජර් ගිණුම් මඟින් පවත්වා ගත යුතුය.
ii. ණය ලබා දීමේ ක්‍රියාපටිපාටිය සහ ප්‍රතිමූල්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් වෙනම ගිණුම් පවත්වා ගත යුතුය.
iii. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරික්ෂාව සහ විමර්ශනය සඳහා ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය ඕනෑම විටක ඉදිරිපත් කල යුතු අතර මෙම ණය යෝජනා ක්‍රමය සම්බන්ධව ඕනෑම තොරතුරක් ලබා දීමට බැංකු බැඳී සිටී.

15.9 මෙහෙයුම් උපදෙස් හි සඳහන් පරිද්දෙන් සියලු ලියාපදිංචි සහ ප්‍රතිමූල්‍ය කටයුතු සිදුවිය යුතුය.

**16. වෙනත්**

මෙම පරිශිෂ්ඨයෙහි මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 හි අඩංගු නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ අයිතිය හෝ සහභාගීත්ව මූල්‍ය ආයතන ණය යෝජනා ක්‍රමය තුලින් ඉවත් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුවේ.

මෙයට විශ්වාසී,

එම්. එස්. කේ ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව